කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

*දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය*

**වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය**

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍යය) උපාධි පළමු පරීක්ෂණය (බාහිර) - 2015

සැප්තැම්බර් - 2020

**BMGT E1025 - ව්‍යාපාර ගණකාධිකරණය**

කාලය : පැය 03 යි

<u>උපදෙස්</u>

i. A කොටසේ සහ B කොටසේ සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ii. ප්‍රශ්න සංඛ්‍යාව :

A කොටස - ප්‍රශ්න 10 යි

B කොටස - ප්‍රශ්න 04

iii. A කොටසට අදාල පිළිතුරු <u>අනිවාර්යයෙන්ම ප්‍රශ්න පත්‍රයෙහිම</u> සඳහන් කළ යුතු අතර, එය පිළිතුරු පොතෙහි ඇමිණිය යුතුයි.

iv. ප්‍රශ්න පත්‍රයේ A කොටස විභාග ශාලාවෙන් පිටතට ගෙනයාමෙන් වලකින ලෙස ඔබට තරයේ අවවාද කරනු ලැබේ.

v. ගණක යන්ත්‍ර භාවිතා කල හැකිය.

## <u>A කොටස</u>

**මෙම කොටසේ 1 - 10 දක්වා ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමේදී නිවැරදි පිළිතුර යටින් පැහැදිලිව ඉරක් අඳින්න.**

(01) පහත ව්‍යාපාර අතරින් කවර ව්‍යාපාරයක් අයිතිකරුවන්ගේ පුද්ගලික වත්කම් ව්‍යාපාරයේ ණයහිමියන්ගෙන් ආරක්ෂා කර ගැනීමට උපකාරීවේද?

 අ) තනි පුද්ගල ව්‍යාපාරයක්

ආ) සීමාසහිත සමාගමක්

ඇ) සීමාසහිත සමාගමක් සහ හවුල් ව්‍යාපාරයක්

ඈ) හවුල් ව්‍යාපාරයක්

(02) ජංගම වත්කම් අනෙකුත් වත්කම්වලින් වෙන්කර දක්වනුයේ,

අ) එම වත්කම් කවර කලකදී මුදල් බවට පරිවර්තනය කිරීමට බලාපොරොත්තු වන්නේද යන්න මතය.

ආ) එම වත්කම් ස්පෘශ්‍ය ද නැතහොත් අස්පෘශ්‍ය ද යන්න මතය.

ඇ) එම වත්කම්වල වර්තමාන වෙළඳපොල වටිනාකම තීරණය කිරීමේ හැකියාව මතය.

ඈ) එම වත්කම් ඉදිරි වර්ෂය තුලදී අනෙකුත් ආයතනවලට ගෙවීමට ඇති මුදල් ප්‍රමාණය මතය.

(03) මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ හා ඉදිරිපත් කිරීමේ සංකල්පනාත්මක රාමුව අනුව පහත ලක්ෂණ අතුරින්, මූල්‍ය ප්‍රකාශනවල මූලික ගුණාත්මක ලක්ෂණයක් වන්නේ,

අ) සැසඳිය හැකිබව

ආ) අදාලබව

ඇ) අඛණ්ඩ පැවැත්ම

ඈ) රහස්‍ය බව

(04) මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ හා ඉදිරිපත් කිරීමේ සංකල්පනාත්මක රාමුව අනුව පහත ලක්ෂණ අතුරින් මූල්‍ය ප්‍රකාශනවල ගුණාත්මක ලක්ෂණ තවදුරටත් වැඩි දියුණු කරන ලක්ෂණයක් වන්නේ,

අ) විශ්වාසනීය නියෝජ්‍යත්වය

ආ) සැසඳිය හැකිබව

ඇ) අදාල බව

ඈ) රහස්‍ය බව

(05) දේපල පිරියත හා උපකරණවල ක්ෂය ගණනය කිරීම සඳහා ඉවහල් වන ගිණුම්කරණ සංකල්පය හෝ මූලධර්මය පහත ඒවා අතරින් කුමක්ද?

අ) උපලබ්ධි සංකල්පය.

ආ) උපචිත සංකල්ප

ඇ) ගැලපුම් සංකල්ප

ඈ) ව්‍යාපාර ඒකක සංකල්පය

(06) ABC සමාගම යුරෝපීය රටවල් සඳහා ඇඟලුම් නිෂ්පාදනය හා අපනයනය සිදුකරන අතර එම සමාගම පසුගිය වසර පහ සඳහා තම ව්‍යාපාරික කටයුතු සිදුකරන ලදී. කෙසේ නමුත් කොරෝනා වසන්ගත තත්ත්වය නිසා ඉදිරියේදී මෙම සමාගමේ ඇඟලුම් සඳහා වන ඉල්ලුම පහත වැටේ යැයි අපේක්ෂා කෙරේ. ඔබ මෙම සමාගමේ ගණකාධිකාරීවරයා වශයෙන් 2020 ජූනි මස 30 න් අවසන් කාර්තුව සඳහා කාර්තුමය මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරමින් සිටින බව උපකල්පනය කරන්න. එම ක්‍රියාවලියේදී සහතික කරගතයුතු මූලික ගිණුම්කරණ සංකල්පය කුමක්ද?

අ) සැසඳිය හැකිබව
ආ) අඛණ්ඩ පැවැත්ම
ඇ) අදාලබව
ඈ) ආරක්ෂණ සංකල්පය

(07) මොටෝ (පුද්ගලික) සමාගම දේශීය වෙළඳපොල සඳහා පොලිතීන් බෑග් නිෂ්පාදනය කරන අතර ඔබ එහි හිමිකරුවා යැයි උපකල්පනය කරන්න. මෙම ව්‍යාපාරය පුළුල් කිරීම සඳහා ඔබ අදහස් කරන අතර ඒ සඳහා මහජනතාව වෙත කොටස් නිකුත් කිරීමක් සිදුකිරීමට අදහස් කරනු ලැබේ. මහජනතාව සඳහා කොටස් නිකුත් කිරීමට මෙම සමාගමට හැකියාව පවතින්නේද?

අ) ඔව්. මොටෝ සමාගමට මෙම කොටස් නිකුතුව සිදුකල හැක.
ආ) නැත. මොටෝ සමාගමට මෙම කොටස් නිකුතුව සිදුකල නොහැක.
ඇ) ඔව්. නමුත් 50% ක කොටස් නිකුතුවක් තම ආයතනයේ සේවකයන් සඳහා සිදුකල යුතුය.
ඈ) ඔව්. නමුත් කොටස් නිකුත් කල හැක්කේ අනුමත ප්‍රමාණයෙන් 50% ක් සඳහා පමණි.

(08) ලැයිස්තුගත නීති (listing rules) අදාල වනුයේ,

අ) සියලුම පෞද්ගලික සමාගම් සඳහා
ආ) සියලුම සීමිත පොදු සමාගම් සඳහා
ඇ) සියලුම මිලකල සමාගම් සඳහා
ඈ) සියලුම බහුජාතික සමාගම් සඳහා

(09) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුව මූල්‍ය ප්‍රකාශනවල මූලිකාංග මිනුම් කිරීම සඳහා යොදාගත හැක්කේ පහත කුමන මිනුම්කරණ පදනම්ද?

A - ඓතිහාසික පිරිවැය
B - සාධාරණ අගය
C - උපලබ්ධි වියහැකි අගය
D - වර්තමාන අගය

අ) A සහ B පමණි.
ආ) A සහ C පමණි.
ඇ) A, B සහ C පමණි.
ඈ) A, B, C සහ D පමණි.

(10) පහත තොරතුරු DD සමාගමෙන් උපුටාගන්නා ලදී.

| | (රු.) |
|---|---|
| දළ ලාභය | 9,600 |
| විකුණුම් පිරිවැය | 14,400 |
| අනෙකුත් ආදායම | 3,000 |

DD සමාගමේ දළ ලාභ අනුපාතය වනුයේ,

අ) 66.66% ආ) 40%

ඇ) 55.17% ඈ) 31.25%

**(10 x 02 = මුළු ලකුණු 20)**

## B කොටස

ප්‍රශ්න අංක 01

2020 මාර්තු 31 දිනට සීමිත පබළු සමාගමෙහි කෙටුම්පත් කල ශේෂ පිරික්සුම පහත පරිදි වේ.

| | රු. හර | රු. බැර |
|---|---|---|
| ඉඩම් | 4,100,000 | - |
| යන්ත්‍ර | 181,260 | - |
| මෝටර් රථ | 2,370,440 | - |
| ගොඩනැගිලි | 5,100,000 | - |
| ක්ෂය වෙන්කිරීම් (2019/04/01 දිනට) | | |
| යන්ත්‍ර | | 27,190 |
| මෝටර් රථ | | 74,088 |
| ගොඩනැගිලි | | 2,550,000 |
| ස්වාධිකාරය | 273,600 | |
| විකුණුම් | | 14,535,000 |
| තොගය (2019/04/01 දිනට) | 525,800 | |
| ගැනුම් | 7,612,760 | |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ | 1,476,860 | |
| බැංකු | 60,056 | |
| බෙදාහැරීමේ වියදම් | 1,374,860 | |
| පරිපාලන වියදම් | 2,102,640 | |
| වෙනත් ආදායම් | | 539,000 |
| මූල්‍ය වියදම් | 1,090,800 | |
| කුලී ආදායම් | | 730,000 |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (එකක් රු. 10) | | 2,000,000 |
| රඳවාගත් ලාභය | | 3,733,606 |
| ආයෝජන | 3,120,640 | |
| බදු වෙන්කිරීම (01/04/2019 දිනට) | | 144,000 |
| ගෙවූ ආදායම් බදු | | |
| 2018/ 2019 තක්සේරු වර්ෂය සඳහා | 135,000 | |
| 2019/ 2020 තක්සේරු වර්ෂය සඳහා | 63,000 | |
| පොලී සහිත දිගුකාලීන ණය | | 1,508,400 |
| ගෙවිය යුතු විශ්‍රාමික දීමනා | | 1,950,120 |
| කෙටිකාලීන ණය | | 610,992 |
| ගෙවූ අතුරු ලාභාංශ (ශුද්ධ) | 172,000 | |
| වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ | | 891,600 |
| බැංකු අයිරාව | | 465,720 |
| | **29,759,716** | **29,759,716** |

අතිරේක තොරතුරු

(i) 2020 මාර්තු 31 වන දින තොගයේ පිරිවැය රු. 426,000 ක් වන අතර ශුද්ධ උපලබ්ධි අගය රු. 416,000 ක් වේ.

(ii) 2019 සැප්තැම්බර් 30 වන දින සමාගම රු. මිලියන 2 ක් වටිනා පරිගණක මිලට ගෙන ඇති අතර ඒවාට අදාල මෙහෙයුම් පද්ධති (Operating systems) මිලදී ගැනීම සඳහා රු. මිලියනයක් යොදවා ඇත. මෙම පරිගණක හා මෙහෙයුම් පද්ධතිවල අපේක්ෂිත ඵලදායී ජීවිත කාලය වසර 5 කි. සමාගම මේ සඳහා වන ගිණුම් කිසිවක් තබා නැත.

(iii) සමාගමෙන් නෙරපූ සේවකයෙක් රු. 500,000 ක වන්දියක් ඉල්ලා සමාගමට එරෙහිව නඩු පවරා ඇත. සමාගමේ නීතිඥවරුන්ගේ මතය වන්නේ මෙම වන්දි මුදල සමාගමට ගෙවීමට සිදුවන බවය.

(iv) වාර්ෂික ක්ෂය සරල මාර්ග ක්‍රමයට පහත දැක්වෙන අනුපාතවලට සිදුකල යුතුය.

| | ක්ෂය අනුපාතය |
|---|---|
| යන්ත්‍ර | 12.5% |
| මෝටර් රථ | 20% |
| ගොඩනැගිලි | 5% |

(v) සමාගම තම ගණුදෙනුකරුට සපයන සේවාවක් ලෙස තම භාණ්ඩ සඳහා වගකීම් සහතිකයක් ලබාදේ. මේ අනුව සමාගම, තම ගනුදෙනුකරුවනට භාණ්ඩ අලෙවියෙන් පසු වසරක කාලයක් ඇතුලත අළුත්වැඩියා කිරීම හෝ භාණ්ඩයට එම භාණ්ඩයක් ලබාගැනීමට අවකාශ සලසා දෙනු ලබයි. මෙම අළුත්වැඩියා කටයුතු සඳහා වන වියදම විකුණුම් වලින් 2% යැයි ඇස්තමේන්තු ගත කර ඇති අතර මේ සඳහා ගිණුම් තබා නොමැත.

(vi) සමාගම තම ස්වාධිකාරය, එය අත්පත් කරගනු ලැබූ 2018/04/01 දින සිට වසර 06 පුරාවට ක්‍රමක්ෂය කලයුතු නමුත් මේ සඳහා ගිණුම්තබා නොමැත.

(vii) 2020 මාර්තු 31 වන දිනට සිටින කොටස්හිමියන් සඳහා අයිතිවාසිකම් නිකුතුවක් සිදුකර ඇත. මේ යටතේ සෑම කොටස් හතරක් හිමි අයෙකුට එක් කොටසක් බැගින් රු. 40 ක මිලකට සිදුකල මෙම හිමිකම් නිකුතුව සම්බන්ධයෙන් ගිණුම් තබා නොමැත.

(viii) 2019/2020 තක්සේරු වර්ෂය සඳහා ආදායම් බදු ඇස්තමේන්තුව රු. 120,000 ක් වන අතර 2018/2019 තක්සේරු වර්ෂය සඳහා වූ ආදායම් බදු මුදල සම්පූර්ණයෙන්ම ගෙවා ඇත.

(ix) සමාගම පොලී සහිත දිගුකාලීන ණය 2019 ජූනි මස 30 වන දින 10% ක පොලී අනුපාතිකයක් යටතේ ලබාගෙන ඇති අතර මේ සම්බන්ධයෙන් පොලී ගලපා නොමැත.

(x) 2020 මාර්තු 31 වන දින සමාගම සතු ඉඩම් රු. 4,500,000 කට ප්‍රත්‍යාගණනය කරනු ලැබූ අතර එය පොත් වල ගලපා නොමැත.

(xi) සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් කොටසකට රු. 0.50 ක ලාභාංශයක් ගෙවීමට 2020 අප්‍රේල් 01 වන දින තීරණය කරන ලද අතර පොදු සංචිතයට රු. 330,000 ක මුදලක් මාරු කිරීමට ද රු. 200,000 ක මුදලක් ප්‍රාග්ධනීත කිරීමට ද තීරණය කරන ලදී.

(xii) අතුරු ලාභාංශ සඳහා වූ 14% ලාභාංශ බදු සමාගම විසින් ගිණුම් තබා නොමැත.

අවශ්‍ය වන්නේ, සීමිත පබළු සමාගමේ ප්‍රසිද්ධ කිරීම සඳහා

අ) 2020 මාර්තු 31 අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශය.

ආ) 2020 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය.

ඇ) 2020 මාර්තු 31 වන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය.

**(මුළු ලකුණු 35)**

**ප්‍රශ්න අංක 02**

(අ) බී.සී (BC) සමාගම තම ව්‍යාපාරික අවශ්‍යතා සඳහා යන්ත්‍රයක් ඉන්දියාවෙන් ආනයනය කරයි. එම යන්ත්‍රයේ මිල ඉන්දියානු රුපියල් (INR) 1,250,000 වේ. මීට අදාල අනෙකුත් තොරතුරු පහත පරිදි වේ.

| | (රු.) |
|---|---|
| මූලික බෙදාහැරීමේ හා හැසිරවීමේ වියදම් | 549,200 |
| ආපසු ගෙවන බදු | 50,500 |
| උපදේශන කටයුතු සඳහා වන වියදම් | 550,000 |
| වාණිජ මෙහෙයුම් කටයුතුවලට පෙර සිදුවූ මෙහෙයුම් අලාභය | 120,250 |
| යන්ත්‍රය ගලවා ඉවත් කිරීමේ වියදම් (වසර 4 කට පසු දැරීමට සිදුවේ) | 400,800 |

INR 1 = LKR 2.32

අවශ්‍ය වන්නේ LKAS 16 ට අනුව මෙම යන්ත්‍රයේ පිරිවැය ගණනය කිරීම (ආයතනයේ ප්‍රාග්ධන පිරිවැය 15% ක් බව උපකල්පනය කරන්න).

(ලකුණු 05)

(ආ) ශ්‍රීලක් මහතාහට කුඩා පරිමාණයේ සපත්තු නිෂ්පාදන කිරීමේ හා බෙදාහැරීමේ ව්‍යාපාරයක් ඇත. මෙම ව්‍යාපාරයේ පොත්වලින් උපුටා ගන්නා ලද පහත තොරතුරු 2020 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා අදාල වේ.

(රු. 000)

| | |
|---|---|
| තොගය 2019/04/01 දිනට | |
| අමු ද්‍රව්‍ය | 1,500 |
| නොනිමි (ප්‍රාථමික පිරිවැයට) | 8,900 |
| නිමි භාණ්ඩ | 12,500 |
| අමුද්‍රව්‍ය මිලට ගැනුම් | 32,600 |
| සෘජු වේතන | 45,000 |
| ආපසු එවුම් - අමුද්‍රව්‍ය | 1,800 |
| ආපසු යැවුම් - නිමි ද්‍රව්‍ය | 800 |
| පිටතින් මිලදී ගන්නා ලද සපත්තු | 17,200 |
| අනෙකුත් සෘජු පිරිවැය | 3,000 |
| විකුණුම් | 120,000 |
| නිෂ්පාදන වැටුප් | 600 |
| අනෙකුත් නිෂ්පාදන පොදු කාර්යය | 1,500 |
| අනෙකුත් පරිපාලන වියදම් | 610 |
| විදුලිය | 3,000 |
| උපකරණ නඩත්තු වියදම් | 1,200 |
| ක්ෂය - මෝටර් රථ | 15,000 |
| කර්මාන්ත ශාලා කුලිය | 5,000 |
| බැංකු වියදම් | 220 |
| පොදු වියදම් | 1,000 |

අනෙකුත් තොරතුරු පහත පරිදි වේ.

(i) 2020/03/31 දිනට තොගය පහත පරිදි වේ.

| | |
|---|---|
| අමු ද්‍රව්‍ය | රු. 2,100,000 |
| නොනිමි (ප්‍රාථමික පිරිවැයට) | රු. 10,500,000 |
| නිමි භාණ්ඩ | රු. 8,500,000 |

(ii) 2020/03/31 දිනට උපචිත විදුලිය රු. 600,000 ක් වන අතර බැංකු ගාස්තුවලින් 80% ක් අමුද්‍රව්‍ය ආනයනය සඳහා අදාල වේ.

(iii) වියදම් පහත පරිදි නිෂ්පාදනය සඳහා අදාල වේ.

| | |
|---|---|
| විදුලිය | 80% |
| ක්ෂය - මෝටර් රථ | 75% |
| උපකරණ නඩත්තු වියදම් | 50% |
| පොදු වියදම් | 60% |

අවශ්‍ය වන්නේ,

ශ්‍රීලක් මහතාගේ ව්‍යාපාරය සඳහා 2020 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා නිෂ්පාදන ගිණුම පිළියෙල කිරීම.

(ලකුණු 10)

**(මුළු ලකුණු 15)**

**ප්‍රශ්න අංක 03**

(අ) 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ අනුව 44 වන වගන්තිය හවුල් ව්‍යාපාරයකට අදාල කරගත යුත්තේ කුමන අවස්ථාවකදී ද යන්නත් එය අදාල කරගත යුතු ආකාරයත් පැහැදිලි කරන්න.

(ලකුණු 03)

(ආ) X, Y සහ Z හවුල්කරුවන් ලාභ/ අලාභ බෙදාගනිමින් X, Y, Z සහ සමාගම පවත්වාගෙන යනු ලබයි. එම හවුල් ව්‍යාපාරයේ 2019 දෙසැම්බර් 31 දිනට උපුටා ගන්නා ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශය පහත පරිදි වේ.

| වගකීම් | රු. | | වත්කම් | රු. |
|---|---|---|---|---|
| ප්‍රාග්ධනය | 150, 000 | | ඉඩම් හා ගොඩනැගිලි | 120, 000 |
| X 50, 000 | | | පිරියත හා උපකරණ | 200, 000 |
| Y 100, 000 | | | තොගය | 300, 000 |
| දිගුකාලීන ණය | 500, 000 | | ණයගැතියෝ | 100, 000 |
| ණයහිමියෝ | 100, 000 | | Z ගේ ප්‍රාග්ධනය | 30, 000 |
| | **750, 000** | | | **750, 000** |

2020 ජනවාරි 01 දින මෙම හවුල් ව්‍යාපාරය පහත කොන්දේසි මත සීමිත සමාගමක් බවට පරිවර්තනය කිරීමට තීරණය කරන ලදී.

(i) ඉඩම් හා ගොඩනැගිලි රු. 200,000 අගය කරන ලදී.

(ii) පිරියත හා යන්ත්‍ර රු. 250,000 කට අගය කරන ලදී.

(iii) තොගයෙන් 10% ක් නෂ්‍ය වූ තොග වශයෙන් කපා හරින ලදී.

(iv) ණයගැතියන්ගෙන් 10% ක් බොල් ණය ලෙස කපා හරින ලදී.

(v) ණයහිමියන්ට පියවීමේදී 6% ක සහනයක් ලබා දෙන ලදී.

(vi) නව සමාගම රු. 15 සාමාන්‍ය කොටස් 10,000 ක් සහ එකක් රු. 100 බැගින් වූ 8% ණයකර 660 නිකුත් කරන ලදී. මෙම කොටස් හා ණයකර හවුල්කරුවන් අතර ඔවුන් ලාභ/ අලාභ බෙදාගන්නා අනුපාතයට බෙදාහැරිය යුතුය.

අවශ්‍ය වන්නේ,

උපලබ්ධි ගිණුම, හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම සහ නව සමාගමේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය.

(ලකුණු 12)

**(මුළු ලකුණු 15)**

**ප්‍රශ්න අංක 04**

TST සමාගමේ 2020 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය පහත පරිදි වේ.

| | | රු. |
|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | |
| දේපල පිරියත හා උපකරණ | | 1,800,000 |
| දිගුකාලීන ආයෝජන | | 600,000 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | **2,400,000** |
| | | |
| **ජංගම වත්කම්** | | |
| තොගය | 180,000 | |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ | 276,000 | |
| කෙටිකාලීන ආයෝජන | 324,000 | |
| මුදල් හා මුදල් සමාන දෑ | 240,000 | |
| **මුළු ජංගම වත්කම්** | | 1,020,000 |
| **මුළු වත්කම්** | | **3,420,000** |
| | | |
| **හිමිකම් හා වගකීම්** | | |
| **හිමිකම්** | | |

| | | |
|---|---|---|
| සාමාන්‍ය කොටස් | | 1,080,000 |
| 8% නිදහස්කල හැකි සමුච්චිත වරණීය කොටස් (1 ක් රු. 10 බැගින් වූ) | | 1,080,000 |
| පොදු සංචිත | | 464,400 |
| රඳවාගත් ලාභය | | 648,000 |
| **මුළු හිමිකම** | | **3,272,400** |
| | | |
| **ජංගම වගකීම්** | | |
| වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ | | 147,600 |
| **මුළු හිමිකම හා වගකීම්** | | **3,420,000** |

2020 අප්‍රේල් 01 දින සමාගම තම 8% නිදහස් කලහැකි සමුච්චිත වරණීය කොටස්වලින් අඩක් (50%) 10% ක අධි මිලකට නිදහස් කිරීමට තීරණය කරන ලදී. මේ සඳහා සමාගම තම කෙටිකාලීන ආයෝජනය රු. 344,000 ක මුදලකට විකිණීමටත් ඉතිරිය සඳහා එකක් රු. 12.50 බැගින් සාමාන්‍ය කොටස් නිකුත් කිරීමටද තීරණය කරන ලදී. කෙසේ නමුත් කොටස් නිකුත් කිරීමෙන් ලැබෙන මුදල් වලින් 80% ක් පමණක් මේ සඳහා යොදා ගැනීමටත් ඉතිරිය දනට ව්‍යාපාරය සතු මුදල් වලින් ගෙවීමටත් තීරණය කරන ලදී.

අවශ්‍ය වන්නේ, වරණීය කොටස් නිදහස් කිරීමෙන් පසු TST සමාගමේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය.

(ලකුණු 09)

(ආ) පහත දැක්වෙන පද කෙටියෙන් හඳුන්වන්න.

(i) ප්‍රකාශිත ප්‍රාග්ධනය

(ii) මහා පරිමාණ ප්‍රාග්ධන අලාභ

(iii) නුබුන්වත්භාවයේ පරීක්ෂණය

(ලකුණු 06)

**(මුළු ලකුණු 15)**